# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## 2004 අංක 4 දරන ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2004 ජනවාරි මස 21 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2004 ජනවාරි මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 5.50 යි. තැපැල් ගාස්තුව : රු. 4.50 යි.

# 2004 අංක 4 දරන ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2004 ජනවාරි මස 21 වන දින]

එල්. ඩී.– ඕ. 65/2002

1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

1. මේ පනත 2004 අංක 4 දරන ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 27 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :– — 1996 අංක 2 දරන පනතේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි–

(අ) ඒ වගන්තියේ (අ) ඡේදයේ "යම් විෂ සහිත පුපුරන හෝ විසංඥභාවයට පත් කරන යම් ද්‍රව්‍යයක් හෝ" යන වචන වෙනුවට "යම් විෂ සහිත පුපුරන හෝ (ඩයිනමයිට් ඇතුළු) විසංඥභාවයට පත්කරන යම් ද්‍රව්‍යයක් හෝ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :–

"(ආ) (අ) ඡේදයේ සඳහන් යම් කාර්යයක් සඳහා විෂ සහිත පුපුරන හෝ (ඩයිනමයිට් ඇතුළු) විසංඥභාවයට පත් කරන යම් ද්‍රව්‍යයක් හෝ (දැල් ආම්පන්න නොවන) හිංසක හෝ අනතුරුකාරී වෙනත් යම් දෙයක් හෝ ද්‍රව්‍යයක් රැගෙන යාම හෝ සන්තකයේ තබා ගැනීම නොකළ යුතු ය."

(2) ඒ වගන්තියේ (2) සහ (3) උපවගන්තිවල "විෂ සහිත පුපුරන හෝ විසංඥභාවයට පත් කරන යම් ද්‍රව්‍යයක්" යන වචන වෙනුවට "විෂ සහිත, පුපුරන හෝ (ඩයිනමයිට් ඇතුළු) විසංඥභාවයට පත් කරන යම් ද්‍රව්‍යයක්" යන වචන ආදේශ කිරීමෙන්.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 29අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :— — ප්‍රධාන ප්‍රඥප්තියට 29අ වගන්තිය ඇතුළත් කිරීම.

2—H 18815—4,500 (03/07)

"පූර්වනිගමනය. 29ආ. 27 වන වගන්තියේ සඳහන් යම් වරදක් සඳහා වූ යම් නඩු පැවරීමක දී, පටහැනිව කරුණු ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ විෂ සහිත පුපුරන හෝ (ඩයිනමයිට් ඇතුළු) විසඳභාවයට පත් කරන යම් ද්‍රව්‍යයක් හෝ හිංසක හෝ අනනුරුකාරී වෙනත් යම් ද්‍රව්‍යයක් රැගෙන යන ලද්දේ හෝ සන්තකයේ තබා ගනු ලැබුවේ, 27 වන වගන්තියේ සඳහන් යම් කාර්යයක් සඳහා බවට උපකල්පනය කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට අලුතින් 46අ වගන්තිය ඇතුළත් කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 46අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

"ඇප ලබාදීම. 46අ. මේ පනතේ 27 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ), (ආ) ඡේද යටතේ හෝ 27 වන වගන්තියේ (3) උපවගන්තිය යටතේ යම් වරදකට වරදකාරරෝපිත වූ යම් තැනැත්තකුට මහේස්ත්‍රාත්වරයකු විසින් ඇප ලබා නොදිය යුතු ය :

එසේ වුව ද, අධිකරණය සෑහීමට පත්වන පරිදි පෙන්වා දෙන ලද විශේෂ අවස්ථානුගත කරුණුවල දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවනු ලැබූ පළාත් මහාධිකරණය විසින් මේ පනතේ 27 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) හෝ (ආ) ඡේද යටතේ හෝ (3) වන උපවගන්තිය යටතේ වරදකට වරදකාරරෝපිත වූ එකී තැනැත්තාට ඇප ලබා දිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය, ඒ වගන්තියේ (3) වන උප වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ :—

"(3) මේ පනතේ 27 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ හෝ (3) වන උපවගන්තියේ විධිවිධාන කඩකරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු තුනකට නො අඩු සහ අවුරුදු පහකට නො වැඩි බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් එක් ලක්ෂයකට නො අඩු දඩයකට හෝ දෙවන වරට හෝ ඊට

පසු වාරයක දී වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු පහකට නො අඩු සහ අවුරුදු හතකට නො වැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් පන් ලක්ෂයකට නො අඩු දඩයකට ඔහු යටත් විය යුතු ය.

(3අ) ඒ පනතේ 27 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ නැතහොත් (2) වන උපවගන්තියේ විධිවිධාන කඩකරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු එකකට නො අඩු සහ අවුරුදු තුනකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් පනස් දහසකට නො අඩු දඩයකට නැතහොත් දෙවන හෝ පසු අවස්ථාවක වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු තුනකට නො අඩු සහ අවුරුදු පහකට නො වැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමකට හෝ දෙවන වරට හෝ පසු අවස්ථාවක දී වරදකරුවීමේ දී අවුරුදු තුනකට නො අඩු සහ අවුරුදු පහකට නො වැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් එක් ලක්ෂයකට නො අඩු දඩයකට ඔහු යටත් විය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියට 49අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 49අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

"අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ අනුමතිය.

49අ. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පූර්ව ලිඛිත අනුමතිය ඇතිව මිස 27 වන වගන්තිය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් කිසිම නඩු පැවරීමක් ආරම්භ නොකළ යුතු ය.''.

සිංහල හා දෙමළ හාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

7. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 8[illegible]0 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.